# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

## සමාගම් (සංශෝධන)

**2007 අංක 07 දරන සමාගම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යතුමා විසින් 2019 මැයි මස 07 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2018 ඔක්තෝබර් මස 02 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[277 වන පනත් කෙටුම්පත]


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 12.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) 2007 අංක 07 දරන සමාගම් පනතේ 5 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ එම සමාගමේ ඇතැම් විස්තර ලබාදෙමින් අලුත් සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳ පොදු මහජනතාවට නිවේදනය කිරීම සඳහා සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත හැකියාව ලබාදීම වේ.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ එම සමාගම සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනයක් කිරීමේ අවශ්‍යතාව ඉවත් කිරීම වේ.

***4 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ, 5(1)(ඈ) සහ 9(2) වගන්තිවල විධිවිධාන සැලකිල්ලට ගනිමින් යම් සමාගමක නාමය වෙනස් කිරීම සඳහා එම සමාගම වෙත විධාන කිරීමට සමාගම් රෙජිස්ට්‍රාර්වරයාට හැකියාව ලබාදීම වේ.

එල්.ඩී.—ඕ. 70/2017

## 2007 අංක 07 දරන සමාගම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මෙම පනත 2019 අංක  දරන සමාගම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2007 අංක 07 දරන සමාගම් පනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) සහ (ඇ) ඡේද ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— 2007 අංක 07 දරන පනතේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ආ) සමාගමේ අංකය ලෙස ඒ සමාගමට පරම අංකයක් වෙන් කර දිය යුතු ය;

(ඇ) නියමිත ආකෘතියෙහි වූ සංස්ථාගත කිරීමේ සහතිකයක් ඉල්ලුම්කාර සමාගමට නිකුත් කළ යුතු ය; සහ

(ඈ) සමාගමක් සංස්ථාපිත කර වැඩ කරන දින හැටක් ඇතුළත සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවලින් දිනපතා බෙදහරින පුවත්පතක පළකරනු ලබන දැන්වීමක් මගින්—

(i) සමාගමේ නම;

(ii) සමාගමේ ලියාපදිංචි අංකය; සහ

(iii) සමාගමේ ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය,

මහජනතාවට දැනුම් දිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි (1) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්; සහ

(2) එහි (3) වන උපවගන්තියේ “(1) වන හෝ (2) වන උපවගන්තිය” යන වචන වෙනුවට “(2) වන උපවගන්තිය” යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

“(ආ) 5 (1) (ඇ) වගන්තිය සහ 9 (2) වන වගන්තිය යටතේ නම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම පළකිරීමෙන් මාස තුනක කාලයක් ඇතුළත, වෙනත් සමාගමක් හෝ ලියාපදිංචි කළ විදේශීය සමාගමක් විසින්—

(i) පළමුවෙන් සඳහන් කළ සමාගමේ නම, ව්‍යාකූලතාවයක් ඇතිවීමට ඉඩ ඇතිවිය හැකි පරිදි ඉල්ලීම කරන සමාගමේ නමට බෙහෙවින් සමාන වන අවස්ථාවක; සහ

(ii) විරුද්ධ වී ඇති නමින් පළමුවෙන් සඳහන් කළ සමාගම ලියාපදිංචි කිරීමට පළමුව ඉල්ලීම කරන සමාගම එහි වත්මන් නමින් ලියාපදිංචි කර ඇති අවස්ථාවක, හෝ

සමාගමේ නම වෙනස් කරන ලෙසට රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විටෙක; හෝ ”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.